**ශීර්ෂය - 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2.3 (ඇ) | අධිකරණ අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහන 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහන 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | දෙපාර්තමේන්තුවට අයත් වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

#### (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් හඳුනාගෙන තැන්පත් කළ යුතු ඇප ප්‍රමාණයද තීරණය කර අදාල නිලධාරීන්ට දැනුම් දී ඇත. ඇප තැන්පත් කිරීමේ අයදුම්පත්‍ර ගෙන්වා ගැනීමට රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය වෙත ලිපියක් යොමු කර ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු අතර මුදල් රෙගුලාසි 880 අනුව ඇප ලබා ගැනීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව භාර හා බූදල්වලට අදාලව මහා භාරකාර ආඥා පනත යටතේ අය කරන ලද මූලධන, ආයෝජන ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු ලෙස රු.8,500,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර රු.19,214,500ක ආදායමක් රැස් කර තිබූ බව 2023 මාර්තු 10 දිනැති හා අංක PT/2/CA/3/3/5/2/(II) වෙළුම දරන ලිපිය අනුව නිරීක්ෂණය විය. එය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 226 කි. ඒ අනුව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවෙහි නව භාර/බූදල් පිහිටුවීම, විහාර වන්දි, විදේශ වන්දි මුදල් ඉදිරියට ලැබීම හා පොලී ප්‍රතිශතයන්හි වෙනස්වීම් පිළිබඳව නිවැරදි පුරෝකථනයක් සිදු කිරීමේ ඇති අපහසුතාව මත ආදායම් හා ඇස්තමේන්තු ගත අගය අතර විචල්‍යතාවක් ඇති වී ඇත. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් | අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රධානතම අංගයක් වන භාර බූදල් අවසාන ගිණුම් සකස් කිරීම නව ගිණුම් මෘදුකාංගය මඟින් ආරම්භ කර ඇති අතර ඒ පිළිබඳව විගණනය ද දැනුවත් කර ඇත.<br><br>ස්ථාවර වත්කම් ලේඛනගත කිරීමේ කටයුතු ද මෙම වර්ෂයේ ආරම්භ කරන ලදී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන, ක්‍රියාකාරී සැලැස්ම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මු.රෙ. (506) "බී" ප්‍රකාර වාර්ෂික සැසඳුම් ප්‍රකාශය නියමිත කාලසීමාව තුල ලබා දුන්නද භාර බුදල් අවසාන ගිණුම් ලබා දීමේදී ප්‍රමාදයක් සිදුවී ඇත. 2023 වර්ෂයේ අවසාන ගිණුම් නියමිත කාලසීමාව තුළ ලබා දීමට මේ වන විට කටයුතු සම්පාදනය කර ඇත. විගණන වාර්තාවේ දෙමළ පරිවර්තනය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. මෙම වසරේ වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති අතර කෙටුම්පතද විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1922 අංක 01 දරන මහා | භාර/බුදල් ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු වුවත් 2021 | 2021 වර්ෂයේ පුද්ගල භාර, විමර්ශන, | අදාල ගිණුම් නියමිත දිනට විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| | භාරකාර ආඥා පනතේ 47(1) වගන්තිය | වර්ෂයේ ගිණුම්වලින් කොටසක් හා 2022 වර්ෂයට අදාල භාර/බුදල් අවසානගිණුම් මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වෛද්‍යාධාර අංශ වල අවසාන ගිණුම් නව භාර බුදල් පද්ධතිය මඟින් ලබා ගෙන විගණනයට ඉදිරිපත් කර ඇති අතර අනෙක් අංශ වල අවසාන ගිණුම් කඩිනමින් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | ඉදිරිපත් කළ යුතු වීම. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යේ 3.3 වගන්තිය | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01හි දක්වා ඇති පරිදි ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සාරාංශ වාර්තා සකස් කිරීමට අවශ්‍ය උපදෙස් මේ වන විට ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ යේ 02 ජේදය | රාජ්‍ය ආයතන සඳහා රක්ෂණ පහසුකම් ලබා ගැනීමේදී වෙළඳපොල තුළ ක්‍රියාත්මක ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රජය සතු ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුළින් රක්ෂණ ආවරණයක් සලසා ගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව සෘජුවම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණ සේවාවන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | රථවාහන රක්ෂණ කටයුතු රජය සතු ආයතනයක් වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සිදු කර ඇති අතර ඉදිරියේදී රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි ආයතන වලින් මිල ගණන් කැඳවා රක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ යේ 3.1.6 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මාස 03 ක කාල ප්‍රමාදයකින් පසුව 2022 ජූලි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන වතු 11 ට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2021 හා 2022 වර්ෂවලට අදාලව වතු භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩල මේ වන විට පත් කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. |
| (v) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ යේ 11.1 ඡේදය | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 15 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂයන්ට අදාළව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම අදාළ කාල රාමුව තුළ සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත කාලරාමු තුළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | අදාළ කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම සිදු කළ යුතු වීම. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන පොදු ජංගම ගිණුමේ වර්ෂ කිහිපයක සිට හඳුනා නොගත් සෘජු ලැබීම් පවතින බව නිරීක්ෂණය වූ අතර 2023 පෙබරවාරි 28 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් සෘජු ලැබීම් එකතුව රු.2,719,188 ක් විය. | මේ වන විට මෙම සෘජු ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | හඳුනා නොගත් සෘජු ලැබීම් කඩිනමින් හඳුනා ගෙන විධිමත් පරිදි ගිණුම් ගත කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කර තිබුණේ 2022 නොවැම්බර් 16 දින වේ. | විගණන වාර්තාවේ දෙමළ පරිවර්තනය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම ප්‍රමාදය ඇති විය. මෙම වසරේ වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති අතර මේ වන විට කෙටුම්පතද විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | කාර්යසාධන වාර්තාව අදාල කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති කාර්යසාධන දර්ශක 10 න් 03 ක තත්‍ය නිමැවුම, අපේක්ෂිත නිමැවුමෙන් සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර වතු කළමනාකරණ අංශයේ අපේක්ෂිත නිමැවුම සියයට 54 ක සෘණ අගයක් ගෙන තිබුණි. | අර්බුදකාරී තත්ත්වය හා ඉන්ධන හිඟය නිසා නියමිත කාලසීමාව තුළ ස්ථාවර තැන්පත් පොලී මුදල් චෙක්පත් නොලැබීමත් තැපැල් සේවය අක්‍රියවීම නිසා වවුචර්පත්/ලිපි ආදිය යැවීම හා ගෙන්වා ගැනීම ප්‍රමාදවීමත් හේතුවෙන් වර්ෂයට අදාළව අරමුණු ඉටු කිරීමේ ප්‍රමාදයන් සිදුවිය. පසුගිය වර්ෂයේ වැඩි කාලසීමාවක් පාසල් වසා දැමීම හේතුවෙන් වාර්තාවන් කැඳවීමට නොහැකි වීම මත ශිෂ්‍යාධාර ගෙවීම් කටයුතු අඩපණ විය. | හඳුනාගත් ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ බූදලයන් යටතේ පවරා දෙන ලද වතු දේපළ 11 ක් 2022 වර්ෂය අවසානය වන විට මහා භාරකාරතැන විසින් කළමනාකරණය කරමින් පැවති අතර එම දේපළ විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමින් ස්ථාපකගේ අරමුණු ඉටුකිරීම අපේක්ෂා කෙරේ. එසේ වුවද, මෙම වතුවල ආදායම් වැඩිකර ගැනීම තුළින් අදාල බූදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය වන අතර සමාලෝචිත වර්ෂයේ වතුවල සමස්ත ශුද්ධ අලාභය රු.2,526,485 ක් බවට පත්ව තිබුණි. | වතුවල ආදායම වැඩි කර ගැනීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. | වතු සම්බන්ධ අධීක්ෂණ කටයුතු විධිමත් කිරීම කළ යුතු වීම. |
| (ආ) | සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 17 ක් වූ හැරී හපුගොඩ බූදලයට අයත් ගාල්ල නියාගම ප්‍රදේශයේ මත්තක වත්ත නමැති ඉඩමෙහි අක්කර 1 රූඩ් 1 පර්චස් 2 ක භූමි ප්‍රමාණයක් නිශ්චිතව හඳුනාගෙන ආරක්ෂිත මායිම් නිරවුල් කරගැනීමටත් ආරක්ෂිත වැට ඉදිකර කෘෂිකාර්මික කටයුත්තක් සඳහා යොදවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | මූල්‍ය තත්ත්වය අයහපත් වූ නිසා මෙම කොටසේ වගාකිරීම් කටයුතු ප්‍රමාද විය. නමුත් මූල්‍ය තත්ත්වය යහපත් වී ඇති බැවින් තේ වගා කිරීමට සැලසුම් කර ඇත. | එම ඉඩම නිශ්චිතව හඳුනාගෙන, මැනුම් කටයුතු සිදුකර, ආරක්ෂිත වැට ඉදිකර සුදුසු කෘෂිකාර්මික වගාවක් සඳහා යොදාගත යුතු වීම. |
| (ඇ) | හැරී හපුගොඩ බූදලයට අයත් සුදුවැලිපොත වත්තෙහි අන්කුඩුව නමැති බිම කොටසෙහි අක්කර 13.5 ක පමණ රබර් වගාකළ | හැරි හපුගොඩ බූදලයට අයත් අන්කුඩුව නමැති අක්කර 13.5 ක ඉඩමේ පැරණි රබර් වගාව වර්ෂයේ මිල ගණන් කැඳවා අලෙවි කිරීම සිදු කර ඇත. | නැවත වගා කිරීම සඳහා රජයේ සහනාධාර ලබා ගැනීමේ හැකියාව සලකා බැලීම හා |

| | | | |
|---|---|---|---|
| | ඉඩමෙහි නැවත පැළ වගාවන් සිදු කළ යුතුව පවතින බව නිරීක්ෂණය විය. මෙම වත්තෙහි පවතින අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ද දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ඉහත සඳහන් වත්තෙහි පිහිටි වතු බංගලාව කඩිනමින් පිළිසකර කිරීමක් අවශ්‍ය බවද නිරීක්ෂණය විය. | මුදල් තත්ත්වය අයහපත් මට්ටමක පවතින බැවින් නැවත වගා කටයුතු සඳහා අරමුදල් සපයාගැනීමේ ගැටලුවක් මතුවී ඇත. ඉදිරියේදී මෙම ඉඩම සංවර්ධනය කිරීම හෝ බදු පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අනවසර ඉදිකිරීම් පවතින වතුවල මැනුම් කටයුතු සිදුකර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | එන්. ඩී. එස්. සිල්වා විජේසිංහ බූදලයට අයත් කලුතර දිස්ත්‍රික්කයෙහි පිහිටි රිච්මන්ඩ් මන්දිරය වර්ෂ 100 කට අධික ඉතිහාසයක් සහිත පෞරාණික වැදගත්කමකින් හෙබි මන්දිරයක් බැවින් කඩිනමින් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් බූදල්කරුගේ අන්තිම කැමති පත්‍රයෙහි පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ ලැයිස්තුවක් සඳහන් කර තිබූ අතර එම කෞතුක භාණ්ඩ ඉහත සඳහන් මන්දිරයෙහි තැන්පත් කර සංරක්ෂණය කළ යුතු බව සඳහන් කර තිබුණි. එසේ වුවද එම කෞතුක භාණ්ඩ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බවත් අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව සොයා බැලීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. | මන්දිරය පසුපස කොටසේ වහලෙහි වැහිපීලි අලුත්වැඩියා කර තීන්ත ආලේප කටයුතු 2022 වර්ෂයේ දී සිදුකර ඇති අතර තත්ත්ව වාර්තාවක් ලබා ගැනීමට ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත රු.150,000ක මුදලක් ගෙවා ඇත. එසේම අලුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැය වන බැවින් ආරක්ෂක අංශවල ශ්‍රම දායකත්වය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්තුමා මඟින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත. | මන්දිරය සහ එහි පවතින කෞතුක භාණ්ඩ සංරක්ෂණය කිරීමට සහ අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව සොයා බැලීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | අයි. ඩබ්ලිව්. සී. විජේරත්න බූදලයට අයත් නෝර්ටන් බ්‍රිජ්හි පිහිටි නිවස හා ඉඩම | ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලයක් | බාහිර පාර්ශවයන්ට බූදල් දේපල බදු පදනමින් ලබා |

| | | | |
|---|---|---|---|
| | 1993 දෙසැම්බර් 07 දින වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙන යෑම සඳහා ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණි. එහෙත්, බුදලයට අයත් නිශ්චල දේපළ, වෙනත් පාර්ශවයක් වෙත ලබාදීමේදි නිවස භාරදීම හා නඩත්තු කිරීම යනාදී කරුණු පිළිබඳව විධිමත් පරිදි එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා ගිවිසුමකට එළඹීය යුතු වුවත් වර්ෂ 29 ක් ගත වී තිබුණද, විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | පිහිටුවීමටත් වැඩිහිටි නිවාසය පවත්වාගෙන යාමට අදාලව ආරක්ෂක භාරකරු ලෙස මහා භාරකාරතැන පත්කර භාරයක් පිහිටුවීමටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | දීමේදී විධිමත් බඳු ගිවිසුම්වලට එළඹිය යුතු වීම. |
| (ඊ) | සී. ඊ. වනිගසූරිය බුදලයට අයත් දේපළ විකුණා බුදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එසේ වුවද, එම බුදලයට අයත් ඇතැම් දේපල විකිණීමට කටයුතු කර තිබුණද සෙසු දේපලවල හිමිකාරීත්වය හඳුනා ගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත් එම දේපළ විකුණා බුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි. | අන්තිම කැමති පත්‍රයට අනුව සී.ඊ. වනිගසූරිය බුදලයට අයත් දේපල කිහිපයක් නිසි පරිදි හඳුනා ගෙන එම දේපල විකුණා සී.ඊ. වනිගසූරිය භාරය නමින් තැන්පත් කර මේ වන විටත් අදාළ අරමුණු ඉටු කරමින් පවතී. ඊට අමතරව අනෙකුත් දේපල සඳහා සී.ඊ. වනිගසූරිය මහතාට ඇත්තේ නොබෙදූ පංගු හිමිකාරීත්වයකි. ඒ අනුව අදාළ හිමිකාරීත්වය හඳුනා ගත යුතුය. එකී නොබෙදූ දේපලවල අනවසර පදිංචිකරුවන් සිටින බැවින් ඒ සඳහා නිසි අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කිරීමට සිදුව ඇත. | අදාල ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු කර බුදල්කරුගේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 ජනවාරි 27 දින අංක 65 - 0763 දරන වාහනයට අදාලව සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු. 254,038 ක අලාභය, අදාල | මෙම කරුණ සොයා බැලීම සඳහා තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කර ඇත. | අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

රියැදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභ වී තිබූ අතර අනතුර සිදු වී වසර 15 ක් ගත වුවද අදාල පාඩුව වගකිව යුතු අයගෙන් අය කර ගෙන පොත්වලින් කපා හැරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් බූදලයට අයත් සයිමන්ඩේල්වත්ත ඉඩමෙහි රජයට පවරාගෙන තිබුණු අක්කර 16 රූඩ් 01 පර්චස් 35ක් වෙනුවෙන් තීරණය වූ වන්දි මුදල සම්බන්ධයෙන් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථා දෙකකදී පිළිවෙලින් රු. මිලියන 2.63 ක් සහ රු. මිලියන 1.79 ක් බව දැනුම් දී තිබුණද අදාල වෙනස නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දිනය වන විටත් ගෙන නොතිබුණි. | රජයට පවරා ගත් ඉඩමේ මු.පි. 8043 දරන කොටස ගම් පුළුල් කිරීම යටතේ අඩු ආදායම්ලාභීන් වෙත පවරාදීමට වෙන් කරන ලද ඉඩම් කොටස වේ. අනෙකුත් ඉඩම් කොටස් සඳහා වන්දි සහ ඒ සඳහා පොළී ලැබී ඇත. පිඹුරු අංක 8043 දරන කොටස සඳහා නියමිත වන්දි මුදල හා පොළිය ගෙවීම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කැස්බෑව වෙත දන්වා ඇත. වන්දි මුදලේ වෙනස සම්බන්ධයෙන් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙතින් විමසීම් කර ඇත. මෙම නිරවුල් කිරීමට ප්‍රාදේශීය ලේකම් ඉදිරි නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. ඒ සම්බන්ධව හා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු වන්දි මුදල් සම්බන්ධව 2023.03.17 දිනැතිව නැවත විමසීම් කර ඇත. | රජයට පවරාගත් බූදල් ඉඩම්වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රි ලංකාවේ | උරුමකරුකරුවන් සොයා ගැනීම සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් 2010.11.12 දින සිංහල සහ ඉංග්‍රීසි පුවත්පත් | අර්ථලාභීන්ට මුදල් ගෙවීමට කටයුතු කළ යුතු බව හා මුදල් ගෙවන තෙක් |

| | | | |
|---|---|---|---|
| | පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට/ අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරවරයා පත්කර තිබූ අතර දේපල විකිණීමෙන් ලද රු. 64,645,776 ක මුදලින් උරුමකරුවන්/අර්ථලාභීන් 30 දෙනෙකුට රු.35,880,064 ක මුදලක් ලබාදී තිබුණද 16 දෙනෙකු වෙත ලබා දිය යුතුව පවතින රු. 28,765,712 ක මුදල, දේපළ විකුණා වර්ෂ 23 ක කාලයක් ගත වී තිබුණද ලබා දීමට කටයුතු කර නොතිබුණි. | දෙකෙහිම පළ කර ඇත. ඒ අනුව ඉදිරිපත්වූ උරුමකරුවන් 36 දෙනා වෙත ගෙවීම් සිදුකර ඇත. ඉතිරි 16 දෙනා ඉදිරිපත් වී නොමැති බැවින් එම මුදල් 2019 වර්ෂයේ දී ආයෝජනය කර ඇත. මෙම අර්ථලාභීන් අතරින් බහුතරය විදේශගතවී සිටින අතර ඔවුන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කලද එය සාර්ථක වී නොමැත. | අරමුදල් එළදායී අයුරින් ආයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | ආර්.එල්. එච්. චන්ද්‍රසේකර යන අයගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොතානේගම පිහිටි ඉඩම සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩුවෙන් මහා භාරකාරතැන වෙත හිමිව තිබූ ගොඩ ඉඩමේ පර්චස් 30 ක් සහ කුඹුරු ඉඩම් අක්කර 05 ක් සඳහා තාවකාලික භාරකරුවෙකු පත් කර තිබුණද විධිමත් බදු ගිවිසුමකට එළඹීමට මෙම වාර්තාවේ දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, නිශ්චිත වශයෙන්ම අද ගොවියා විසින් වගාකළ කුඹුරු ප්‍රමාණය, ගොඩ ඉඩම් ප්‍රමාණය සහ ඉන් ලද අස්වැන්න සම්බන්ධයෙන් අධීක්ෂණය හෝ පසු විපරම් කර නොතිබුණු බවත් අද ගොවියා විසින් ඔහුගේ කැමැත්ත පරිදි ගෙවන ප්‍රවේණිය පමණක් භාරගෙන ගිණුම් ගත කර තිබූ බවත් නිරීක්ෂණය කෙරේ. | මෙම බූදලයට අදාලව පැවති 1/99T නඩුකරයෙන් මහා භාරකාරතැනට අවාසිදායක ලෙස තීන්දුව ලැබීම නිසා අභියාචනයක් අනුරාධපුර සිවිල් අභියාචනාධිකරණයේ ගොනු කරන ලදී. අදාල නඩුවෙහි ඇතිවූ සමථය ප්‍රකාරව මහා භාරකාරතැන වෙත ගොඩ ඉඩමේ පර්.30 ක් සහ කුඹුරු ඉඩමෙන් අක්.05 ක් හිමිවිය. නඩුව පැවති අවධියේ කුඹුරු ඉඩම තාවකාලිකව බදුකරුවෙකුට ලබාදුන් අතර ඔහු විසින් රජයේ සම්මත ප්‍රමාණය අනුව ප්‍රවේණිය ගෙවා ඇති බව නිරීක්ෂණය වේ. නඩුව සමථයකට පත්වීමෙන් අනතුරුව නව බදුකරුවෙකු වෙත පවරා ඇති අතර ඒ අනුව විධිමත් බදු ගිවිසුමකට එළඹීමට නියමිතය. | බාහිර පාර්ශවයන්ට බූදල් දේපල බදු පදනමින් ලබා දීමේදී දේපලවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු බව හා බදු පැහැර හැර ඇති දේපල නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 වර්ෂය දක්වා එළදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු වීරසිංහ අබේනායක බූදලයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැඟිල්ල 2013 පෙබරවාරි 05 දින රු. 8,000 ක මාසික කුළියකට බදු දී තිබූ අතර බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ අවසරය ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත බදුකරුටම මාසිකව රු.10,000 ක මුදලකට බදු දී තිබුණි. | අධිකරණ නියෝග ප්‍රකාරව දේපල විකුණන තෙක් තාවකාලිකව බදු දී ඇති බව ලිපිගොනු අනුව නිරීක්ෂණය වේ. පසුව අනවසර පදිංචිකරුවෙකු හේතුවෙන් ඔහු ඉවත් කිරීමට නීතිමය කටයුතු සිදු කරන බැවින් මෙතෙක් දේපල විකිණීමේ කටයුතු සිදු කළ නොහැකි වී ඇත. 2023 ජුලි මස 04 වන දිනට නඩුව කැඳවීමට නියමිතය. | විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැගිලි විකුණා බූදලයේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බූදලයට අයත් ගාල්ල ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි කඩකාමරයක් හා ඉඩමක් වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබූ අතර රු. 1,100,000 ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු. 227,380 ක් ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 143,400 ක් ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද බදු කුලී අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මෙම බූදලයට අයත් තක්සේරු වටිනාකම රු.2,300,000 ක් වූ ඉඩම මේ වන විට විකුණා ඇත. රු.1,100,000 ක වටිනාකමකින් යුතු කඩකාමරයෙහි බදු කුලී නොගෙවා රැඳී සිටීම වෙනුවෙන් එන්තරවාසි යවා ඇත. එයට පිළිතුරු ලෙස අවු. 1 ½ ක් ඇතුළත මිලදී ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. ඒ සම්බන්ධයෙන් නීති උපදෙස් ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. | බාහිර පාර්ශවයන්ට බූදල් දේපල බදු පදනමින් ලබා දීමේදී දේපලවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු බව හා බදු පැහැර හැර ඇති දේපල නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි ජී. එස්. ජයසූරිය නැමැති අයගේ බූදලය | ජී. එස්. ජයසූරිය බූදලය මඟින් අරමුණු ඉටු කිරීම 2022 වර්ෂයේදී ආරම්භ කර ඇත. | දෙපාර්තමේන්තුවට නෛතික හිමිකමක් ඇති දේපල |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් වූ අද්මිනිස්ත්‍රාසි බලතල 1982 වර්ෂයේදී මහා භාරකාරතැන වෙත ලැබී තිබුණු අතර බුදල්කරුගේ නැසීගිය පළමු බිරිදට අයත්ව තිබූ ඉඩමක් 1999 වර්ෂයේදී රජයට පවරාගෙන තිබුණි. එමෙන්ම ඇයගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කොන්දේසි ප්‍රකාරව එම ඉඩම සඳහා බුදල්කරුට හිමිකමක් නොතිබුණි. එසේ වුවද,එම ඉඩම සඳහා නඩුවක් පවරා වන්දි හිමිකම් ඉල්ලුම් කර 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු ලෙස රු.2,962,430 ක වියදමක් දරා තිබුණි. 2019 ඔක්තෝබර් 23 දින ලද අංක 522/00/විශේෂ දරන එම නඩුවේ නියෝගය ප්‍රකාරව එකී දේපළට අදාලව වන්දි හිමිකමක් නොමැති බව තීන්දු කර තිබුණි. එබැවින්, හිමිකමක් නොමැති දේපළක් වෙනුවෙන් අනවශ්‍ය ලෙස කාලය හා අරමුදල් වැය කර තිබූ අතර තවදුරටත් නීතිඥ ගාස්තු ගෙවිය යුතුව පවතින බවත් නිරීක්ෂණය විය. | බිරිඳගේ දේපල සඳහා බුදල්කරුට හිමි අයිතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වන්දි සඳහා ඉල්ලුම් කර වන්දි පරීක්ෂණයට යොමු වී ඇති අතර ඒ සඳහා වෙනත් පාර්ශවයක් විසින් හිමිකම් පා ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් විසින් මහා භාරකාරතැන පාර්ශවකරුවකු කරමින් නඩු පවරා ඇත. නඩුවේ තීන්දුව ප්‍රකාරව මහා භාරකාරතැනට වන්දි සඳහා හිමිකම් අහිමි කර ඇතත් එකී නඩුකරය සඳහා මහා භාරකාරතැන වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහත්වරුන්ට වෘත්තීය ගාස්තු කොටසක් ගෙවීම් කර ඇති අතර තවමත් නොගෙවූ වෘත්තිය ගාස්තු ද පවතී. | සම්බන්ධයෙන් පමණක් නඩු කටයුතුවලට සම්බන්ධ විය යුතු වීම. |
| (උ) | හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම බුදලයේ ආදායමින් 1/5 ක් ඉතිරි කළ යුතු බවත් එම ඉතිරිය රු. 100,000 ක් වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බවත් දක්වා තිබුණි. එසේ වුවත් එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉතිරි කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ | හැරී හපුගොඩ බුදලයට අයත් වතුවල හර ශේෂයක් පවතින බැවින් ආදායමින් 1/5 ක් ඉතිරි කර අරමුණු ඉටු කිරීමේ හැකියාවක් ලැබී නැත. ඉදිරියේදී වතු ලාභදායී පදනමින් පවත්වා ගෙන යාමට සැලසුම් සකස් කර ඇත. | අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ 5 ක කාලය තුළ රු.24,865,439 ක ආදායම් උපයා තිබුණු අතර එයින් රු. 4,973,088 ක් ඉතිරි කළ යුතු වුවත් එසේ ඉතිරි කර නොතිබුණි. වතු සම්බන්ධයෙන් නිසි කළමනාකරණයකින් යුක්තව කටයුතු නොකිරීම හේතුවෙන් වර්තමානයේ අදාල වතුවල හර ශේෂයක් පවතින බවත් ඒ හේතුවෙන් බුදලයට අදාල අරමුණු ඉටු කිරීමට නොහැකිව ඇති බවත් නිරීක්ෂණය විය. | | |
| (ඍ) | විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 254 විවෘත කිරීම සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් රු.2,629,250 ක් වැය කර තිබුණු අතර එම වියදම ඩී.එස්.ඩබ්.සමරකෝන් බුදලයේ අරමුදල් භාවිත කර ගෙවා තිබුණි. එම බුදලයට අදාලව ඉටුකළ යුතු කාර්යයන් බුදල්කරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර තිබූ බැවින් මෙම වියදම් දැරීම බුදල්කරුගේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය කෙරේ. | අධිකරණ කාර්යයන් අවසානයේදී අන්තිම කැමති පත්‍රවල ඇති දේපලවලින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනමට මහා භාරකාරතැනගේ අභිමතය පරිදි අදාල බුදලයෙන් ගෙවීම් කර ඇත. නඩුව මෙතෙක් අවසන් වී නොමැත. | බුදල්කරුවන් විසින් අන්තිම කැමති පත්‍රවල නිශ්චිතව සඳහන් කර ඇති අරමුණු ඉටු කිරීම සඳහා පමණක් බුදල් දේපල උපයෝජනය කළ යුතු වීම. |
| (එ) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ එකතුව රු. 14,950,471 ක හර ශේෂයක් ඇතිවන පරිදි භාර/බුදල් 10 ක් සම්බන්ධයෙන් වියදම් දරා තිබුණු අතර, ඉන් භාර/බුදල් 6 කට අදාලව එකතුව රු. 1,325,505 ක් වූ හර ශේෂයන් පියවීම සඳහා එම බුදල්වල ආයෝජන කිසිවක් නොවීය. | ප්‍රමුඛ බැංකුවෙහි සිදු කළ ආයෝජන සඳහා නිසි පරිදි පොලී නොලැබීමත්, අර්ථලාභීන්ට ගෙවීම් කිරීමට සිදුවීමත්, බුදල් කළමනාකරණයේදී පිරිවැයක් දැරීමට සිදුවීමත් හේතුවෙන් මෙම හර ශේෂ ඇති විය. ආයෝජන ආදායම් හා ගෙවල් කුලී ආදායම් වැඩි කිරීම මඟින් එම ශේෂ පියවීමට සැලසුම් කර ඇත. | එක් එක් භාරය/බුදලය සඳහා ලැබෙන ආදායම් සීමාව තුළ වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | භාර සහ බූදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් අංශ සඳහා වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | භාර සහ බූදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කළ යුතු වීම. |
| (ඔ) | භාර සහ බූදල්වලට අයත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | භාර සහ බූදල් වලට අයත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශය මත ඉදිරියේදී මෙම ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | භාර සහ බූදල්වලට අයත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු 05 ක් හඳුනාගෙන තිබුණු අතර, ඉන් සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ භෞමික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම යන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය පිළිවෙලින් සියයට 24 ක් හා සියයට 47 ක් දක්වා වූ අඩු මට්ටමක පැවතුණි. | ආර්ථික අර්බුදය හේතුවෙන් විශ්වවිද්‍යාල හා පාසල් වැඩි කාලයක් වසා තිබීම හේතුවෙන් පාසල් වලට යවන ලද වවුචර්පත් සම්පූර්ණ කර එවා නොමැති වීම. දෙපාර්තමේන්තුවට ලැබෙන අයදුම්පත් සලකා බලා වෛද්‍යාධාර ගෙවීමට ඇස්තමේන්තු කර තිබුණත් අයදුම්පත් නිසිකලට නොලැබීම මත ගෙවීම් කළ නොහැකි වීම. සම්පූර්ණ වර්ෂයට ඇස්තමේන්තු කළද වර්ෂය අවසන් වීමට පෙර භාර අවසන් කිරීම යන හේතු කාර්යසාධන මට්ටම අඩුවීමට හේතු විය. මෙම වසර තුළදී අදාළ ඇස්තමේන්තුගත ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | හඳුනාගත් ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 87 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 67 ක් විය. ඒ අනුව නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර 2015 වසරේ සිට භාෂා පරිවර්තක තනතුර පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | භාෂා පරිවර්තක හා පරිපාලන නිලධාරී තනතුරු පුරප්පාඩු පවතින අතර වර්ෂයක කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමින් පරිපාලන නිලධාරියෙකුගේ සේවය ලබා ගෙන ඇත. භාෂා පරිවර්තන සේවයේ හා ඒකාබද්ධ සේවයේ අනෙකුත් පුරප්පාඩු පිලිබඳව PACIS මෘදුකාංග ඔස්සේ යාවත්කාලීන කර ඇත. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම. |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂ 5 එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්ම වූ නිලධාරීන් 18 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | වසර 5 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් අතරින් 17 දෙනෙකු කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන බණ්ඩ-2) සේවයේ දෙපාර්තමේන්තුගත නිලධාරීන් වේ. එබැවින් ඔවුන්ට ස්ථාන මාරු ලබා දීමේ හැකියාවක් නොමැති අතර දැනට එම නිලධාරීන්ගෙන් තිදෙනෙකු කළමනාකරණ සේවා විභාගය (සීමිත) සමත්ව වෙනත් කාර්යාල වෙත පත්වීම් ලබා ගොස් ඇත. අනෙකුත් සේවාවලට අයත් වර්ෂ 5 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරු අයදුම් කර ඇතත් ස්ථාන මාරුවීම් අනුමත වී ඇත්තේ සුළු පිරිසකට පමණි. ස්ථාන මාරු අනුමත වූ නිලධාරීන් එම කාර්යාල වෙත මුදා හැරීම සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරුවීම් ලබා දිය යුතු වීම. |